# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2017 - 2017 අප්‍රේල් මස 28 වැනි සිකුරාදා - 2017.04.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

### විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**
**ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය**
**ඉංජිනේරු තාක්ෂණ ආයතනය - කටුනායක**

ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම - 2017 කණ්ඩායම

කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව, 2017 කණ්ඩායම සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

පහත දක්වා ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී විද්‍යාව, ගණිතය සහ භාෂාව (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) යන විෂයයන් තුන (03) සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම;

සහ

1.2 නාවික ඉංජිනේරු පාඨමාලාව හැර අනෙක් සියලුම පාඨමාලා සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යේ දී ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

නාවික ඉංජිනේරු පාඨමාලාව සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබිම අනිවාර්‍යය වේ.;

සහ

1.3 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් තුන (03) එකවර සමත් වීම;

හෝ

1.4 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් තුන (03) එකවර සමත් වීම. (මෙහි දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ප්‍රධාන විෂයයක් ලෙස සමත් ව තිබිය යුතුය.)

2. වයස - 2017.12.31 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 25 ට නොවැඩි විය යුතුය.

3. පුහුණු කිරීමේ කාලය පිළිබඳ වැඩසටහන් විස්තර :

මෙම පාඨමාලාවේ කාලය වසර හතරකි. මාස 18 ක න්‍යායික උපදෙස් පාඨමාලාව, මාස 30 ක ප්‍රායෝගික පුහුණුව සමග පහත දැක්වෙන ආකාරයට සකස් කර ඇත.

| | |
|---|---|
| මූලික න්‍යායික උපදෙස් වැඩසටහන ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ දී | - මාස 06 |
| මූලික කර්මාන්ත පුහුණුව බාහිර පුහුණු ආයතනවල දී | - මාස 12 |
| සාමාන්‍ය න්‍යායික උපදෙස් වැඩසටහන ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ දී | - මාස 06 |
| සාමාන්‍ය කර්මාන්ත පුහුණුව බාහිර පුහුණු ආයතනවල දී | - මාස 12 |
| විශේෂ න්‍යායික උපදෙස් වැඩසටහන ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ දී | - මාස 06 |
| විශේෂ කර්මාන්ත පුහුණුව බාහිර පුහුණු ආයතන වල දී | - මාස 06 |

මෙම ඉංජිනේරු පාඨමාලාවට අයත් න්‍යායික උපදෙස් හා පාඨමාලා ප්‍රායෝගික කාර්යයන් මෙම ආයතනයේ දී ලබා දෙන අතර, කර්මාන්ත පුහුණුව පිළිගත් කර්මාන්ත ආයතන මගින් ලබා දෙනු ඇත. පාඨමාලාව ආරම්භයේ දී ඉංග්‍රීසි පාඨමාලාවක් පවත්වනු ලබන අතර එයට සියළුම ආධුනිකයින්ගේ සහභාගිත්වය අනිවාර්ය වේ.

4. ආයතනය මගින් පවත්වනු ලබන පාඨමාලා පහත සඳහන් පරිදි වේ :-

අ. සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය

1. සිවිල් - ගොඩනැගිලි සහ ව්‍යුහ ඉංජිනේරු පාඨමාලාව
2. සිවිල් - මහාමාර්ග සහ දුම්රිය මාර්ග ඉංජිනේරු පාඨමාලාව
3. සිවිල් - ජල සහ පාරිසරික ඉංජිනේරු පාඨමාලාව

ආ. විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය

4. විදුලි - විද්‍යුත් හා සන්නිවේදන ඉංජිනේරු පාඨමාලාව
5. විදුලි - විදුලි බල ඉංජිනේරු පාඨමාලාව

ඇ. යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රය

6. යාන්ත්‍රික - ස්වයංචලන ඉංජිනේරු පාඨමාලාව
7. යාන්ත්‍රික - යාන්ත්‍රික (සාමාන්‍ය) ඉංජිනේරු පාඨමාලාව
8. යාන්ත්‍රික - නාවික ඉංජිනේරු පාඨමාලාව

❖ ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ නාවික ඉංජිනේරු පාඨමාලාව, **ISO 9001** තත්ව සහතිකය යටතේ පැවැත්වේ.

❖ නාවික ඉංජිනේරු පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ අන්තර්ජාතික සමුද්‍ර සංවිධානයේ **STCW-95** සහ 7.04 ආදර්ශ පාඨමාලාව හා සම්බන්ධිත නාවික ඉංජිනේරු කාරක මට්ටමේ දැනුම, අවබෝධය සහ ප්‍රවීණතාව පිළිබඳ විධානානුකූල අවශ්‍යතා සපුරාලනු පිණිස වේ.

5. පාඨමාලා මාධ්‍යය - මෙම පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි භාෂාවෙනි.

6. ආධුනිකත්ව ගිවිසුම -

6.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකු විසින්ම ආධුනිකයා සහ පුහුණු වන ආයතනය යන දෙදෙනා වෙත අන්‍යෝන්‍ය වගකීම් පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුල් විය යුතු අතර, පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ දී නැවත ආපසු ගෙවනු ලබන රු.5000 ක තැන්පතු මුදලක් ලබා දිය යුතුය. මෙම තැන්පත් මුදල ආපසු ලබා ගත හැක්කේ ලියාපදිංචියෙන් සති දෙකක් ඇතුලත පාඨමාලාවෙන් ඉවත් වන විට හෝ පාඨමාලාව සාර්ථකව අවසන් කළ පසු පමණි.

6.2 සමෘද්ධි සහනාධාර හිමි පවුලක සාමාජිකයකු නම් ඊට ආදාල මුල් පිටපත් (සමෘද්ධි කාඩ්පත හා ග්‍රාමසේවක නිලධාරි විසින් නිකුත් කරන ලද ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ලිපිය) ඉදිරිපත් කිරීමෙන් ඉහත තැන්පත් මුදලින් නිදහස් විය හැක.

6.3 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකුම පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේදී, ලියාපදිංචි ගාස්තු වශයෙන් නැවත නොගෙ වන රු. 500 ක මුදලක් ආයතනය වෙත ගෙවිය යුතුය.

6.4 පුහුණුව අවසාන වීමෙන් පසුව ආධුනිකයින් සඳහා රැකියා සැපයීමට ආයතනය බැඳී නොමැත.

6.5 මෙම පාඨමාලා සඳහා ලියාපදිංචි වන සියළුම සිසුන් මුළු පාඨමාලා කාලය තුළදී පැමිණීමේ ප්‍රතිශතය, ආයතනය මගින් නිකුත් කර ඇති සීමාවන්ට යටත්ව තබා ගත යුතු අතර එසේ නොවන අවස්ථා වලදී අදාල විභාග වලට පෙනී සිටිය නොහැකි අතර පාඨමාලාවෙන් ඉවත් විය යුතුවේ.

7. සහතික ප්‍රදානය -

සාර්ථක ලෙස න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව අවසන් කර සමත්වන ආධුනිකයින් හට ආයතනයට ඇති සියලුම බැඳීම් වලින් නිදහස් වු පසු, ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ඇත.

8. තෝරාගැනීමේ ක්‍රමය -

8.1 ඉහත අංක 1 ඡේදයෙහි සඳහන් ඇතුලත් කරගැනීම සඳහා වූ අවම සුදුසුකම් සහිත අංක 2 ඡේදයෙහි සඳහන් වයස් සීමාව තුළ වූ අයදුම්කරුවන්ගෙන් පහත දැක්වෙන ක්‍රමයට තෝරාගැනීම සිදුකරනු ලැබේ.

8.2 මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් වූ ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. (ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය - සඳහා සුදුසුකම් ලබන සියලුම අයදුම්කරුවන් වෙත කල් වේලා ඇතිව ඒ බව දැනුම් දෙනු ලැබේ.)

8.3 ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව, කුසලතාවය මත සීමිත අයදුම්කරුවන් පිරිසක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

8.4 ලිඛිත පරීක්ෂණයෙන් සහ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණු පදනම්කොටගෙන පාඨමාලාව සඳහා ආධුනිකයින් තෝරාගනු ඇත.

8.5 නාවික ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් ඔවුන් එම ක්ෂේත්‍රයේ ලියාපදිංචි වීමට පෙර ඔවුන්ගේ වියදමින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

9. අයදුම්පත් -

9.1 ඔබගේ අයදුම්පත් සමග අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස (උ.පෙළ) අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත (විදුහල්පති, ග්‍රාම නිලධාරි, නීතීඥයකු හෝ සමාදාන විනිශ්චකාරවරයෙක් විසින්) බැගින් එවීම අනිවාර්ය වේ. එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.2 සෑම අයදුම්කරුවෙකු විසින්ම තම අයදුම්පත ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් පරිදි නැවත නොගෙවන ගෙවීමක් විභාග ගාස්තු ලෙස (9.3 ප්‍රකාර) ගෙවිය යුතුය. මෙම ගෙවීම දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය.

(අ) රු.200ක් ගෙවා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ කාර්යාලයකින් ලබාගත් අයදුම්පතක් ඉදිරිපත් කරන්නේ නම් ගෙවීම රු. 500 කි.

(ආ) වෙබ් අඩවියෙන් හෝ වෙනත් ආකාරයකින් ලබාගත් අයදුම්පතක් සඳහා ගෙවීම රු. 700 කි.

9.3 මුදල් තැන්පතු තුණ්ඩුව පහත සඳහන් කරුණු සහිතව නිසි පරිදි සම්පූර්ණ කළ යුතුය.

(i) ශාඛා අංකය සහ ගිණුම් අංකය - 276-1-001-8-6351396.

(ii) බැර උපදෙස් - මහජන බැංකුව, කටුනායක, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ රැස් කිරීමේ ගිණුම් අංක 276-1-001-8-6351396. ට බැර පිණිස.

(iii) අයදුම්කරුගේ නම සහ ලිපිනය

9.4 අයදුම්පත් සහ ආයතනය පිළිබඳ වැඩි විස්තර www.iet.edu.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

9.5 කටුනායක, පන්සල පාරේ, ඉංජිනේරු තාක්ෂණ ආයතනයට පැමිණ රු. 200 ක් ගෙවීමෙන් හෝ තැපෑලෙන් අවශ්‍ය නම් රු. 200 ක් වටිනා මුදල් ඇණවුමක් සහ අදාල වටිනාකම සහිත මුද්දර ගැසූ ලිපිනය ලියන ලද අඟල් 9 × 4 ප්‍රමාණයේ ලියුම් කවරයක් ලේඛකාධිකාරි, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක යන ලිපිනයට 2017 මැයි 26 ට පෙර එවීමෙන් අයදුම්පත් ලබාගත හැක. මුදල් ඇණවුම ගණකාධිකාරි, - ඉංජිනේරු තාක්ෂණ ආයතනය නමින් ලබාගත යුතු අතර ගෙවීම් කරන තැපැල් කාර්යාලය "කටුනායක" විය යුතුය. (☎ 011-2252833 : 011-2252834 : 011-2254667)

9.6 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියෙන් හැර වෙනත් පෞද්ගලික ආයතනවලින් අයදුම්පත් මිළදී නොගන්නා ලෙස අවධාරණය කරන අතර, යම් හෙයකින් එවන් අයදුම්පතක් එවන්නේ නම් ඒ සඳහා රු. 700 ක ගෙවීම අනිවාර්ය බව සලකන්න.

9.7 මුදල් ගෙවීම් කරන ලද බැංකු ශාඛාවේ බලයලත් නිලධාරියෙකු විසින් සහතික කරන ලද තැන්පතු රිසිට්පත, අයදුම්පතේ අලවා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, 2017 ජුනි 02 වැනි දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ/විදුහල්පති, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක යන ලිපිනයට එවිය යුතුය. කවරයේ වම්පස කෙළවරේ "විශේෂ ආධුනිකයන් බඳවා ගැනීම - 2017" ලෙස සටහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හෝ අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාරගනු නොලැබේ.


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 මැයි මස 19 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2017 මැයි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ.බ.)

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

9.8 රජයේ කාර්මික ආයතනයක හෝ විශ්ව විද්‍යාලයක පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ උපාධිය, හැදෑරූ හෝ හදාරමින් සිටින අයට මේ සඳහා අයදුම් කළ නොහැක.

9.9 අයදුම්පත් ලැබුණු බවට අයදුම්කරුවන්ට දැනුම් දෙනු නොලැබේ.

9.10 මෙයට අමතරව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ පහත දැක්වෙන කාර්යාල වලට පැමිණ රු.200 ක් ගෙවීමෙන්ද 2017 ජුනි 02 වන දින දක්වා අයදුම්පත් මිල දී ගත හැක.

(i) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
☎ 011-2888782-7

(ii) කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය, 581, ගාලුපාර, කටුබැද්ද, මොරටුව.
☎ 011-2647393,011-2643356

(iii) මෝටර්රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, 07, ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.
☎ 011-2572977, 011-2532182

(iv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 10/4, මල්වත්ත පාර, බදුලුපිටිය, බදුල්ල.
☎ 055-2230644

(v) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 642, විද්‍යාල මාවත, නව නගරය, රත්නපුර.
☎ 045-2228667

(vi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, 27 ඒ, විවෘත විශ්වවිද්‍යාල මාවත, නූපේ, මාතර.
☎ 041-2226958

(vii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 108/2බී, තිවංක බෝධි මාවත, මහනුවර.
☎ 081-2201918

(viii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ගුවන්තොටුපල පාර, අනුරාධපුරය.
☎ 025-2223178

(ix) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල.
☎ 037-2223789

(x) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 44, සෝමසුන්දරම් පාර, චුන්ඩික්කුලි, යාපනය.
☎ 021-2222383

(xi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 07, ග්‍රාමසේවක පටුමග, කල්මුනේ කුඩි 13, කල්මුනේ.
☎ 067-2229357

(xii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 242, හැව්ලොක් පාර, කොළඹ 05.
☎ 011-2597671,011-2587258

(xiii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 326/2, ප්‍රධාන වීදිය, කළුතර දකුණ.
☎ 034-2224239

(xiv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 61/5, මිනුවන්ගොඩ පාර, ගම්පහ.
☎ 033-2232874

(xv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මෝලවත්ත,මැදගම පාර, මාදම්පෙ.
☎ 032-2248250

(xvi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 103, වාරිමාර්ග පෙදෙස, නව නගරය, පොළොන්නරුව.
☎ 027-2223023

(xvii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, කච්චේරිය සංකීර්ණය, මොණරාගල.
☎ 055-2276504

(xviii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 116, කෝවිල පාර, හාවා එළිය නුවරඑළිය.
☎ 052-2223702

(xix) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 11, පන්සල පාර, මණ්දන්ඩාවල, මාතලේ.
☎ 066-2223173

(xx) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 440, නුවර පාර, මිපිටිය, කෑගල්ල.
☎ 035-2223127

(xxi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 395, වක්වැල්ල පාර, ජූල් ගහ, ගාල්ල.
☎091-2235628

(xxii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 34, මිහිඳු මාවත, තංගල්ල.
☎047-2241512

(xxiii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මාන්කුලම් පාර, මුල්ලියාවලයි, මුලතිව්.
☎ 021-2061012

(xxiv) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ඒ 9 පාර, නුවර පාර, ආනන්දපුරම්, කිලිනොච්චිය.
☎ 021-2285615

(xxv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 103/7, තැපැල් කාර්යාලය පාර, ත්‍රිකුණාමලය.
☎ 026-2226569

(xxvi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, 16/1/1 නව කල්මුනෙයි පාර, මඩකලපුව.
☎ 065-2228130

(xxvii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ඕෆ් ෆාර්ක් පාර, වවුනියාව.
☎024-2224679

(xxviii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 952/1, පරණ මූර් වීදිය, නල්ලයාර් වීදිය, මන්නාරම.
☎023-2223404

10. තැපෑලේ දී නැතිවන හා ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් ඉංජිනේරු තාක්ෂණ ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල් ඇතිව සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව හා
කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.

04-716

---

### අධ්‍යාපන අමාත්‍යාංශය

### අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2017

අධ්‍යාපන අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින ප්‍රවාහන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ප්‍රවාහන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2017 අගෝස්තු මස කොළඹ නගරයේ දී පමණක් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. අධ්‍යාපන සුදුසුකම්:

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

02. අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් :

(i) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව ; හෝ
(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව ; හෝ
(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව; හෝ
(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ; හෝ
(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;
(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික හා වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කිරීම;
(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

03. වයස් සීමාව:

ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසන් දිනට වයස අවු.18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30ට නොවැඩි විය යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1999.05.30 දින හෝ ඊට පෙර හා 1987.05.30 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

04. වෙනත් සුදුසුකම්:

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය;
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය;
(iii) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(iv) තනතුරට පත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු 01 හා 02 ඡේද යටතේ සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළ කරන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

05. වැටුප් කාණ්ඩය,

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව එම්එන් 3-2016 මාසික වැටුප් පරිමාණය
(රු.31,040 - 10 x 445-11 x 660 - 10 x 730 - 10 x 750 - 57,550) හිමි වේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත තරග විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත තරග විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

*ලිඛිත විභාගය*

| *විෂය අංකය* | *විෂයයන්* | *කාලය (පැය)* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 01 | 100 | 40% |
| 02 | පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | 02 | 100 | 40% |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01) | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවය, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. |
| 2. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය (කාලය පැය 02) | වාහන අලුත්වැඩියා කිරීම, වාහන නඩත්තු කිරීම, වාහනවල දෝෂ නිගමනය කිරීම, ධාවනයට නුසුදුසු වාහන තීරණය කිරීම,වාහන අමතර කොටස් සවිකිරීම සම්බන්ධ ඇස්තමේන්තු සකස් කිරීම,වාහනවල ඉන්ධන දහනය, වාහන සේවා කිරීම, වාහන රක්ෂණය කිරීම, වාහන ධාවනයේදී ඇතිවන අනතුරු හා අලාභ හානි ආදී තනතුරට අදාළව තාක්ෂණික දැනුම මැන බැලෙන ප්‍රශ්නවලින් සමන්විත වේ.<br>ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය | මෙම විභාගය සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් කොළඹ නගරයේදී පමණක් පවත්වනු ලබන අතර ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. (අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව මධ්‍යස්ථාන සංඛ්‍යාව තීරණය වේ.) |
| සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: | අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි සඳහන් තොරතුරු නිවැරදි දැයි පරික්ෂා කර බැලීම සඳහා පවත්වනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකි. ලකුණු ලබා දෙනු නොලැබේ. |

07. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්තිවල විධිවිධාන අදාළවේ.
(iii) තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත්විය යුතුය.
(iv) 2007.05.28 දිනැති 2007/7 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව භාෂා අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

08. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය:

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් පමණි.
සම්මුඛ පරීක්ෂණයේදී සියලු සහතිකපත්වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් ලේඛනවලින් පමණක් ඕනෑම එකක් පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

09. (i) අයදුම්පත් 2017.05.30 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ.1503, කොළඹ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ.අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A 4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 07දක්වාත් 02 වන පිටුව අංක 08 සිට 13 දක්වාත් 03 වන පිටුව 14 සිට 15 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේදී එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2017" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද,එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු,දිවුරුම් කොමසාරිස්වරයෙකු,නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු, රු.240,360/-ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

(vi) නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත් කිසිම දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ

කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූලද යන්න අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

(vii) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද අදාළ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැලකිය යුතුය.

(viii) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසා සිටිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

(ix) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාගයට පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. එසේ ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(x) විභාග ප්‍රතිඵල
ගැසට් නිවේදනයේ 06 ඡේදයට අනුව විභාගයට පෙනී සිට සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගේ නාම ලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබා දෙනු ඇත. එයට අමතරව විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ඇත.

10. සාවද්‍ය තොරතුරු සැපයීම :
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. විභාග ගාස්තු
විභාග ගාස්තුව රු.600/-කි. එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උපතැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමට ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙනසේ ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරන අතර මුදල් ඇණවුම් සහ මුද්දර භාරගනු නොලැබේ.

12. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණ කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතීනම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2017 අප්‍රේල් මස 21 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය,
පැලවත්ත,
බත්තරමුල්ල.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) ☐

**ආදර්ශ අයදුම්පත්‍රය**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2017
Examination for Recruitment of Transport Officer for Ministry of Education- 2017

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) සිංහල -2 / දෙමළ- 3 / ඉංග්‍රීසි - 4 ☐

01. 1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :———.
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
(උදා: GUNAWARDHANA, H.M.S.K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :———.

02. ලිපිනය:
2.1 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
2.2 රාජකාරි ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :———.
2.3 පෞද්ගලික ලිපිනය : (සිංහලෙන්/දෙමළෙන්) :———.

03. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

04. 4.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 ☐
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
4.2 විවාහක/ අවිවාහක යන වග: විවාහක - 1 ☐
අවිවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. දුරකථන අංකය:
5.1 රාජකාරි ☐☐☐☐☐☐☐☐☐☐
5.2 පෞද්ගලික ☐☐☐☐☐☐☐☐☐☐

06. 6.1 වර්තමාන තනතුර හා සේවා ස්ථානය :———.
6.2 එම තනතුරට පත්වූ දිනය :———.

07. 7.1 උපන් දිනය :
වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
7.2 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :
අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

08. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන්ද? නැතහොත් ලියාපදිංචි කිරීමකින්ද? :———.

09. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

9.1 අධ්‍යාපන සුදුසුකම් :

| විභාගය | වර්ෂය | පෙනී සිටි ප්‍රධාන විෂයයන් | සාමර්ථ්‍යය | පාසලේ නම |
|---|---|---|---|---|
| | | | | |

9.2 වෘත්තීය සුදුසුකම් :

| විභාගය | වර්ෂය | පෙනී සිටි ප්‍රධාන විෂයයන් | සාමර්ථ්‍යය | ආයතනයේ නම |
|---|---|---|---|---|
| | | | | |

10. වෙනත් සුදුසුකම් :———.

11. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :———.

12. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය :
12.1 විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :———.
12.2 ලදුපත් අංකය හා දිනය :———.
12.3 ගෙවූ මුදල :———.

ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයකින් මෙහි අලවන්න.

13. අයදුම්කරුගේ ප්‍රකාශය :
මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා තෝරාගැනීමට නුසුදුස්සෙකු වීමට යටත් බවත් පත් කිරීමෙන් පසුව ඒ බව දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි. තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය :———.

———,
අයදුම්කරුගේ අත්සන

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:
අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ...................... නැමති අය මා පෞද්ගලික වශයෙන් හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත්, 2017........මස........දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේදී තැබූ බවත්, මම සහතික කරමි.

———.
අත්සන සහතික කරන අයගේ අත්සන

දිනය :———.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
(නිල මුද්‍රාවෙන් සනාථ කළ යුතුය)

15. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය:
අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය ඉදිරිපත් කරන මෙම ආයතනයේ .................................... තනතුර දරන ............................................ මයා/මිය/ මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නැති බවත් සහතික කරමි. ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක./නොහැක.

———.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව)

දිනය :———.

04-749

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා High Friction Composite Brake Blocks 45,000 ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදන

ප්‍රසම්පාදන අංකය - SRS/F.7464

01. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (මහා පරිමාණ). සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත සමාන තොග තුනකින් High Friction Composite Brake Blocks 45,000 ක් සැපයීම සඳහා නිෂ්පාදකයන් / සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. නිෂ්පාදකයන් ඇටෝර්නි බලපත්‍රයක් මගින් බලය පවරන ලද බලයලත් ඒජන්තවරයෙකු මගින් තමන්ගේ ලංසු ඉදිරිපත් කළ හැකිය.

02. ලංසු භාරගැනීම 2017.05.24 වැනි දින ප.ව. 2.00 ට (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන රු.12,500/- ක ගාස්තුවක් පමණක් හෝ පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් සමාන වටිනාකම ගෙවීමෙන් අනතුරුව 2017.05.23 වෙනි දින ප.ව. 3.00 ට (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය වෙතින් හෝ විදේශ ශ්‍රී ලංකා දූත කාර්යාල වෙතින් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුය.

04. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපැල් මගින් හෝ අතින් ගෙනැවිත් යොමු කළ යුත්තේ,

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂාකර බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා සම්බන්ධ විය යුත්තේ,

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

| | | |
|---|---|---|
| දුරකතන අංක | : | 94(11)2438078 හෝ 94(11)2436818 |
| ෆැක්ස් | : | 94(11)2432044 |
| ඊමේල් | : | srs@gmail.com |
| වෙබ් අඩවිය | : | www.railway.gov.lk |

යොමු අංකය : SRS/F.7464

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

04-743

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

චාලක ශක්ති උප දෙපාර්තමේන්තුව සඳහා, නැවත ඉහළට පහළට පීලි එල්ලීමේ උපකරණ හා උපාංග සැලසුම් කොට, නිෂ්පාදනය කොට සැපයුම් කොට ක්‍රියාත්මක කිරීමේ ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය - SRS/F.7476

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ චාලක ශක්ති උප දෙපාර්තමේන්තුව සඳහා, නැවත ඉහළට පහළට පීලි එල්ලීමේ උපකරණ හා උපාංග සැලසුම් කොට, නිෂ්පාදනය කොට සැපයුම් කොට ක්‍රියාත්මක කිරීම සඳහා, නිෂ්පාදකයන් /සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. විදේශීය ලංසු කරුවන්හට, තම ලංසු, පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාල්වරයා වෙත ලියාපදිංචි වී ඇති හා ඇටර්නි බලය පවරා ඇති මෙරට පත්කළ නියෝජිතයකු මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක.

02. ලංසු භාරගැනීම 2017.05.25 වැනි දින ප.ව. 2.00 ට අවසන් කරනු ලැබේ.

03. ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන්, 2017.04.07 වැනි දින සිට 2017.05.24 වැනි දින දක්වා, 09.00 පැය හා 15.00 පැය අතර (ශ්‍රී ලංකා වේලාවෙන්) කාලය තුළ ලබාගත හැකි ලංසු ලේඛන සහිත ආකෘති පත්‍ර මගින් ලංසු ඉදිරිපත් කළ යුතු වේ. මේ සඳහා ආපසු නොගෙවන ගාස්තු රුපියල් දොළොස් දහස් පන්සියයක් (රුපියල් 12,500/-) ගෙවිය යුතු වේ. විදේශීය ලංසුකරුවන්, මෙම මුදල පරිවර්තනය කළ හැකි සමාන විදේශ මුදලකින් තම රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයකට ගෙවා, ඉහතින් දක්වා ඇති නියමිත කාලය තුළ අදාළ ලංසු ලේඛන අදාළ තනාපති කාර්යාලය හරහා ගෙන්වා දෙන ලෙසට, ශ්‍රී ලංකාවේ පිහිටි තම රටෙහි තානාපති කාර්යාලය මගින් ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි වෙතින් ඉල්ලා සිටිය යුතුය.

04. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන් හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන් හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙස ඉල්ලීමක් කෙරේ.

05. මුද්‍රා තැබූ ලංසු ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාර දීමෙන්, පහත සඳහන් අය වෙත ලැබීමට සැලැස්විය යුතුය :

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කොට බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා කරුණාකර අමතන්න.

| | | |
|---|---|---|
| දුරකතන අංක | : | 94(11)2438078 හෝ 94(11)2436818, |
| ෆැක්ස් | : | 94(11)2432044 |
| ඊමේල් | : | srs slr@gmailco |
| වෙබ් අඩවිය | : | www.railway.gov.lk |

යොමු අංකය : SRS/F.7476

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

04-744

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

රත්මලාන දුම්රිය අංගනයෙහි පවත්නා ගර්හිත රේඩියේටර් කෝර්, කොයිල් ස්ප්‍රිං හා සාමාන්‍ය යකඩ සුන්බුන් බැහැර කිරීම

ප්‍රසම්පාදන අංකය - SRS/F.7488

01.ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් රත්මලාන දුම්රිය අංගනයෙහි පවත්නා ගර්හිත රේඩියේටර් කෝර් මෙ/ටොන් 25ක්, කොයිල් ස්ප්‍රිං මෙ/ටොන් 80ක් හා සාමාන්‍ය යකඩ සුන්බුන් මෙ/ටොන් 600 ක් බැහැර කිරීම සඳහා මුද්‍රා තැබූ ලංසු දැන් කැඳවනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2017-05-09 වැනි දින පස්වරු. 2.00 ට අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන ලේඛන ගාස්තු රු.10,000 ගෙවීමෙන්, 2017.05.08 වැනි දින ප.ව. 3.00 දක්වා දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුය.

04. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන් හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

05. මුද්‍රා තැබූ ලංසු ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන් පහත සඳහන් අය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී, ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කොට බැලිය හැක. වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් දුරකතන අංකයන්ට අමතන්න :

දුරකතන අංකය : 2438078 , 2436818

යොමු අංකය : SRS/F.7488

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

04-745

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ටොන් 5 නැව්බඩු ප්‍රවාහන ලොරියක් (CARGO LORRY) ප්‍රසම්පාදනය කිරීම

ප්‍රසම්පාදන අංකය - SRS/F.7456

01. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (මහා පරිමාණ). සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ටොන් 05 නැව්බඩු ප්‍රවාහන ලොරියක් ප්‍රසම්පාදනය කිරීම සඳහා සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2017.05.05 වෙනි දින ප.ව. 2.00 ට අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන රු.3,000 ක් පමණක් වන ප්‍රසම්පාදන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව 2017.05.04 වෙනි දින ප.ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය වෙතින් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුය.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපැල් මගින් ඉදිරිපත් කළ යුතු හෝ ගෙනැවිත් භාරදිය යුතු ලිපිනය නම් :

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ලංසු ලිපිලේඛන ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂාකර බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා සම්බන්ධ විය යුත්තේ,
දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

| | | |
|---|---|---|
| දුරකථන අංකය | : | 94(11)2438078 හෝ 94(11)2436818 |
| ෆැක්ස් | : | 94(11)2432044 |
| ඊමේල් | : | srs@gmail.com |

යොමු අංකය : SRS/F.7456

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

04-746

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මඩකලපුව දිස්ත්‍රික්කයේ මණ්මුනයි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

එරුවිල් සහ මාංකාඩු රා තැබෑරුම් රේන්ද විකිණීම - 2017 ජූලි – 2018 ජුනි

අංක 207 දරන 1982.08.20 දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධාන අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය එරුවිල් සහ මාංකාඩු රා තැබෑරුම් සඳහා 2017 ජූලි මස 01 දින සිට 2018 ජුනි මස 30 වැනි දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාරගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා පැමිණ සිටිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් එක්දහස් පන්සියයක (රු. 1,500) මුදලක් මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් නමින් ගෙවා ලබාගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත ලබා ගත හැකිය. ටෙන්ඩර්පත සමග රිසිට්පත අමුණා තිබිය යුතු යි. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2017.05.08 වැනි දින සිට 2017.05.17 වැනි දින ප. ව. 3.00 දක්වා පමණි.

02. ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% ට අඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර්පත්‍ර සමග ඇමිණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකරන ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ දින සිට සති දෙකක් තුළ ඔබ ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේ නම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. තැබෑරුම දැනට පවත්වන ස්ථානයේ ඉදිරි කාලයේත් අඛණ්ඩව තිබේදැයි සහතික නොමැත.

06. ලියාපදිංචි කරන ලද පොල් සහ තල් සමුපකාර සමිති මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම් සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර දැනට සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ද හා රා තැබෑරුම බදු ගෙන පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 හා 2012.01.05 වැනි දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතු ය)

07. මේ සම්බන්ධව වැඩි විස්තර මණ්මුනයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

සෝ-රංකනාතන්,
ප්‍රාදේශීය ලේකම්.

2017 අප්‍රේල් මස 04 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මන්මුනයි දකුණ එරුවිල් පත්තු.

**රා තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථාන**

| *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථාන* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන්* | |
|---|---|---|---|---|
| | | | *දිනය* | *වේලාව* |
| එරුවිල් ගම | එරුවිල් | ඔඔ හද - 4 | 2017.05.18 | පෙ. ව. 11.00 |
| මාංකාඩු ගම | මාංකාඩු | ඔඔ හද - 6 | 2017.05.18 | පෙ. ව. 11.00 |

**සටහන .-** 1. ටෙන්ඩර් මණ්ඩල 2017.05.18 දින පෙරවරු 11.00 ට රැස්වේ.
2. විකුණුම් දින සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම 2017.06.01 දින පෙරවරු 11.00 ට පැවැත්වේ.

04-700

---

**මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2017/2018 වර්ෂය සඳහා මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

**2017.07.01 දින සිට 2018.06.30 දක්වා**

01. 2017 ජූලි 01 වැනි දින සිට 2018 ජුනි 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසිය හා සෑම සුරාබදු බලපත්‍රයක් ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණය යටත් පිරිසෙන් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුයි.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක 13 දරන පම්බල රා තැබෑරුම" සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි රා තැබෑරුමෙහි නම සහ අංකය සඳහන් කොට 2017 මැයි මස 22 වැනි දින පෙ. ව. 10.30 ට පෙර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුයි.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2017 මැයි මස 22 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු යි.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2017.06.12 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අදාළ විය යුතු ය.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

එච්. එම්. එස්. පී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
මාදම්පේ.

2017 අප්‍රේල් මස 07 වැනි දින,
මාදම්පේ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| උතුරු පිටිගල් කෝරළය | පම්බල | පෙ. ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප.ව. 8.00 | 13 | 2017.05.22<br>පෙ. ව. 10.30 | 1,000.00 |

04-730

# රජයේ නොවන දැන්වීම්

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර, පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ට්‍රස්ට්ෆිනිටි ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 21.02.2017
සමාගමේ අංකය : පී වී 120245
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක ඒ 98/1, බල්ලපාන, ගලිගමුව ටවුම

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

පී. ඊ. චම්පික රැද්‍රිගෝ,
සමාගම් ලේකම්.

දුරකථන අංකය : 077-2205857

04-717

---

### අටොර්නි බලය අවලංගු කිරීම

21, සව්ත්ලන්ඩ් පාර, ඩෙන්හැම්, බක්ස්, එංගලන්තය, 94 පදිංචි ලක්ෂ්මන් ඩයස් ධර්මපාල අබේගුනසේකර හෙවත් ලක්ෂ්මන් ඩයස් ධර්මපාල විජේවන්ත අබේගුනසේකර (ශ්‍රී ලංකා ගුවන් බලපත්‍ර අංකඃ N3116171 දරන) යන මම විසින් මහා බ්‍රිතාන්‍යයේ ජී. ඒ. කුරන් සොලිසිටර් මහතා විසින් 2013.01.30 වැනි දින සහතික කල ශ්‍රී ලංකාවේ අකුරැස්සෙ අතුරලියේ ජුල්ගහකොරටුවේ පදිංචි පලිහවඩන කොඩිකාර චන්ද්‍රාවති (ජා.හැ.අංක 385580754V) දරන යන අය වෙත පවරන ලද එකී අටොර්නි බලපත්‍රය සහ අනෙකුත් සියලු අටොර්නි බලපත්‍ර අවලංගු කළ බවත්, එකී අටෝර්නි බලකාරිය විසින් මින්මතු මා වෙනුවෙන් සිදු කරන කවර හෝ ක්‍රියාවක් වලංගු නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයට සහ එහි වාසීන්ට මෙයින් දැනුම් දෙමි.

එල්. ඩී. ඩී. අබේගුනසේකර.

04-714

---

### දැන්වීමයි

වෂී 2007 අංක 7 දරන සමාගම් ආඥපනතේ 9 ඡේදයට අනුව පහත නම සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දන්වනු ලැබේ.

සමාගමේ නාමයඃ සී/සහිත අවුට්රේස් ටෙක්නොලොජි ලංකා (පෞද්) සමාගම
සමාගමේ අංකයඃ පී. වී. 120992
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනයඃ අංක 47/20, කාසල් වීදිය, කොළඹ 08
සංස්ථාගත කළ දිනයඃ- 2017 මාර්තු මස 29 දින

සී/සහිත කෝර්පොරේට් ඇඩ්වයිසරි සේවා (පෞද්) සමාගම,
සමාගම් ලේකම්වරු.

04-721

---

### දැන්වීමයි

වෂී 2007 අංක 7 දරන සමාගම් ආඥ පනතේ 9 ඡේදයට අනුව පහත නම සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දන්වනු ලැබේ.

සමාගමේ නාමය : සී/ස. ක්‍රවුන් බ්‍රික්ස් (ප්‍රයිවට්) සමාගම
සමාගම් අංකය : PV 113542
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාගත කළ දිනය : 2016.05.10 දින

සී/සහිත කෝපොරේට් ඇඩ්වයිසරි
සේවා (පෞද්) සමාගම,
සමාගම් ලේකම්වරු.

04-720

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර, පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : කින්ස්ගරි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 09.12.2016
සමාගමේ අංකය : පී වී 118641
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 25, මඩපාත පාර, බටකැත්තර, පිළියන්දල

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

පී. ඊ. චම්පික රැද්‍රිගෝ,
සමාගම් ලේකම්.

දුරකතන අංකය : 077-2205857

04-718

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 (1) උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව මෙමගින් දැනුම් දෙමි

සමාගමේ නම : මර්කන්ටයිල් ෆෝර්චූන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 121237
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 236, ගාලු පාර, කොළඹ 03.

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
ලේකම්වරු.

අංක 236, ගාලු පාර,
කොළඹ 03.

04-728

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

මහනුවර, හන්තාන පෙදෙස, ගැමුණු මාවත අංක 61/87/1 දරන ස්ථානයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ ගාමක අකිලඥන හේරත් වන මා විසින් වර්ෂ 2015 ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් වික්‍රමසිංහ ආරච්චිගේ ශාන්ත ලක්ෂ්මන් මහතා විසින් ලියා සහතික කළ අංක 953 දරන ඇටෝර්නි බලකරන මත හසලක, පල්ලේවත්ත අංක 47/26 දරන ස්ථානයේ පදිංචි කන්දෙපෑලේ ගෙදර අසංක ලක්රුවන් ගුණරත්න වෙත පවරන ලද ඇටෝර්නි බලය අද සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව මෙයින් දැනුම් දෙමි.

එච්. ඇම්. ජී. ඒ. හේරත්.

04-727

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

රාගම, කැන්දලියද්දපාළුව, අංක 587/04/A දරන ස්ථානයේ පදිංචි රණසිංහ පතිරාජගේ සමදරා දුලාංජලී (ජා. හැ. අ. 817810152 V ) වන මම ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයටත් එහි ජනතාවටත් මින් දැනුම් දෙන වගනම්,

මා විසින් මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් බදුල්ල, මීගහකිවුල, වැලිතුඩුවෙ වත්ත, යන ස්ථානයේ පදිංචි ගජගන් හේවයලාගේ නයන විශ්වජිත් ආරියදාස (ජා. හැ. අ. 882073840 V ) යන අය පත් කරමින් තමරා අබේරත්න ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද අංක 1672 සහ 2016.05.02 දින දරන, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඇටර්නි බලපත්‍ර පොතේ 169 කාණ්ඩයේ 80 පත් ඉරුවේ දිනපොත් අංක 6339 යටතේ 2016.05.25 දතම යටතේ ලියාපදිංචි වී ඇති ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවටත්, මින් ඉදිරියට ඉන් බලපැවැත්මක් නොමැති බවත් ය.

රණසිංහ පතිරාජගේ සමදරා දුලාංජලී.

2017 මාර්තු මස 31 වැනි දින.

04-704

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේ දී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු නගර සභා සීමාව තුළ, ගාලු කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 97 ඒ කෝන්ගහ ග්‍රාම සේවා වසමට අයත් මාගාල්ලේ (කලින් ඇත්තිලිගොඩ) පිහිටි ගංගාරාම හරස් පාර, වරිපනම් අංක 26 සී, දරන **"ටිකිරාවත්ත නොහොත් බාල මහත්මයාගේ වත්ත"** බෙදු වෙන් කල A දරන කැබැල්ල නැවත බෙදු A1 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු අජිත් රන්ජන් වීරසූරිය විසින් මැන සාදන ලද 1994/09/21 දිනැති අංක 783 දරන පිඹුරෙහි ලොට් A1 වශයෙන් නිරූපිත නැමැති ඉඩම සහ එහි පස, ගහකොළ, වැවිලි සහ එයමත වූ සියල්ල ද සමග වේ.

(විශාලත්වය අඃ 0, රූඃ 0, පර්ඃ 12)

වෂී 2017ක් වූ මැයි මස 19 වැනි දින පෙ.ව. 9.30 ට ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජේ. ටී. එල්. නන්දන විසින් සහතික කරන ලද වර්ෂ 2016.06.28 වැනි දිනැති අංක 11170 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදු කිරීම **ලලිත් ලෙනින් සමරසිංහ සහ සද්නා ප්‍රසාදිනී වීරප්පෙරුම** යන අය "බන්ධනදයීන්" ලෙස ද **ලලිත් ලෙනින් සමරසිංහ** යන අය "උකස්කරු" ලෙස ද පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා - 2017.04.07 වැනි දින දි අයිලන්ඩ්, ලක්බිම, තිනක්කුරාල් පුවත්පත් සහ එදින ගැසට් පත ද බලන්න.

දේපළට පිවිසෙන මාර්ගය.- ගාල්ල සිට ගාලු පාර ඔස්සේ මාතර දෙසට මාගාල්ල පාලම දක්වා පැමිණෙන්න. මාගාල්ල පාලම පසු වීමෙන් පසු වමට ඇති ඩබ්ලිව්. පී විජේසූරිය මාවතට හැරී මීටර් 200 ක් ගිය විට වම් පසින් ඇති ගංගාරාම හරස් පාර ඔස්සේ මීටර් 75ක් යන විට විෂය ගත දේපළ වම් පසින් පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැනුම් මුදලේ 10% ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
(4) ප්‍රචාරක වියදම් ද,
(5) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු.500 ද,
(6) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90%ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු සඳහා කළමණාකරු-ණය අය කර ගැනීමේ අංශය, පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03. දුරකථන : 0114667227

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3 (50/3), විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන : 011 3068185 ෆැක්ස් : 011 - 2572940.

04-741

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥ පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංක - 74813049, 74811672, 74812894

පොල්ගහවෙල, මැටිකුඹුර, සන් ලංකා නිෂ්පාදන හි තනි අයිතිකාර සිංහලගේ සංජීව ගුණතිලක හෙවත් සිංහල පේඩිගේ සංජීව ගුණතිලක මහතා යන අයට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017.03.10 දිනැති අංක 2010 දරන ගැසට් පත්‍රයේ හා 2017.02.27 දින "ඩේලි නිව්ස් ", "දිනමිණ" හා "තිනකරන් ", යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥපනතේ 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අය කර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම 2017.05.31 වැනි දින පෙ.ව. 11.00 ට, මහනුවර, ටොරින්ටන් පාරේ, අංක 24 හි පිහිටි ෂොක්මන් සහ සමරවික්‍රම වෙන්දේසිකාර ආයතනයේ වෙන්දේසිකාර විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### පළමු උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, බටහිර උඩපොල ඕතොට කෝරළේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාවෙහි හොඳැල්ලෙහි පිහිටි ගල්පොත්තෙ කුඹුර සහ කෝන්කුඹුර (ඔප්පුව ප්‍රකාර කෝන්ගහකුඹුර) හෙවත් දංගහමුලලියද්ද දූන් ගාර්ඩින් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පද්මදාස විසින් සාදන ලද 2006.07.31 දිනැති (2005 මැයි 15 ඔප්පුව ප්‍රකාර) අංක 4305 දරන පිඹුරෙහි ලොට් 03 ලෙස දක්වා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 03 උතුරට කොළඹ සිට කුරුණෑගලට මහා මාර්ගය සහ එකී පිඹුරෙහි ලොට් 06 ද, නැගෙනහිරට එකී පිඹුරෙහි ලොට් 6 හා 4 ද, දකුණට එකී පිඹුරෙහි ලොට් 4 හා 5 ද, බස්නාහිරට එකී පිඹුරෙහි ලොට් 5 (ඔප්පුවට අනුව ලොට් 04) සහ කොළඹ සිට කුරුණෑගලට මහා මාර්ගය ද මායිම්ව පර්චස් විසිදෙකයි දශම නවයයි එකක (අ.0 රූ.0 පර්. 22.91) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 1293/162 හි ලියාපදිංචි කර ඇත.

2. එකී හොඳැල්ල පිහිටි ගල්පොත්තෙ කුඹුර සහ කෝන්කුඹුර (ඔප්පුවට අනුව කෝන්ගහ කුඹුර) හෙවත් දංගහමුලලියද්ද දූන් ගාර්ඩින් නමැති ඉඩමේ එකී අංක 4305 දරන පිඹුරෙහි ලොට් 04 ලෙස දක්වා විස්තර කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 04 උතුරට එකී පිඹුරෙහි ලොට් 03, 06 හා 02 (ඔප්පුවට අනුව ලොට් 02 හා 08) ද, නැගෙනහිරට එකී පිඹුරෙහි ලොට් 02 හා 08 සහ ඩී.එම්.ආර්.පොඩිනිලමේගේ කුඹුර ද, දකුණට හොඳැල්ල විහාරයේ කුඹුර ද, රංහාමිට හා වෙනත් අයට සහ ඩබ්. එම්. සෝමාවතීට අයත් ඉඩම් ද, බස්නාහිරට බංඩහාමිගේ ඉඩම සහ එකී පිඹුරෙහි ලොට් 5 සහ 3 ද මායිම්ව රූඩ් එකයි පර්චස් එකොළහයි දශම තුනයි හයක (අ.0 රූ. 1 පර්. 11.36) ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 1293/163 හි ලියාපදිංචි කර ඇත.

තව ද පහත විස්තර කර ඇති ඉඩම මතින් සහ ඒ දිගට පාරේ අයිතිය ද ඇත :

එකී හොඳැල්ල පිහිටි ගල්පොත්තෙ කුඹුර සහ කෝන්කුඹුර (ඔප්පුවට අනුව කෝනගහ කුඹුර) හෙවත් දංගහමුලලියද්ද දූන් ගාර්ඩින් නමැති ඉඩමෙහි අංක 4305 දරන පිඹුරෙහි ලොට් 06 (අඩි 14 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 06 උතුරට කොළඹ සිට කුරුණෑගල මහා මාර්ගය සහ එකී පිඹුරෙහි ලොට් 1 ද, නැගෙනහිරට එකී පිඹුරෙහි ලොට් 01, 02 හා 04 ද, දකුණට එකී පිඹුරෙහි ලොට් 04 හා 03 ද, බස්නාහිරට එකී පිඹුරෙහි ලොට් 03 හා කොළඹ සිට කුරුණෑගල මහා මාර්ගය ද මායිම්ව පර්චස් හතයි දශම හයයි හතරක (අ. 0 රූ. 0 පර්. 7.64) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 1293/165 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. කේ. රත්නායක,
කළමනාකරු.

ලංකා බැංකුව,
පොල්ගහවෙල.

04-731

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - පිටකෝට්ටේ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 532C වත්තේගෙදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බොරලැස්ගමුව හි පිහිටි ඇල්හේන පාරේ වරිපනම් අංක 76, දරන කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් 2007 ඔක්තෝබර් 27 සහ 2007 නොවැම්බර් 01 වන දින මැන සාදන ලද අංක 11020 දරන පිඹුරේ ලොට් A දරන ප්‍රමාණය පර්චස් විස්සක (අ. 0 රූ. 0 පර්. 20) විශාල ඉඩම ගොඩනැගිලි, ගහකොළ වගාවන් සහ ඒ තුළ පිහිටි සියලුම දේත් සමග වේ.

නුගේගොඩ, මිරිහාන පාරේ, ජුබිලි කණුවේ, අංක 118/A, දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාව තුළ නීත්‍යානුකූල සමාගමක් වශයෙන් ස්ථාපිත සෙනෙවිරත්න ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස සහ දයාවංස සෙනෙවිරත්න උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2017 ක් වූ මැයි මස 19 වැනි දින පෙ. ව. 10.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.12.16 වන දින රජයේ ගැසට් පත්‍රය ද 2016.12.19 ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.04.28 දින රජයේ ගැසට් පත්‍රය ද 2017.04.28 ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම.- මහරගම සිට කොළඹ පාරේ (හයිලෙවල් පාරේ) මීටර් 400 ක් පමණ ගොස් වමට හැරුණු විට හමුවන ඇල්හේන පාරේ මීටර් 500ක් පමණ ගමන්කළ විට අදාළ දේපළ එම පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයඃ-

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් අකාලිත වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි, (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ පිටකෝට්ටේ ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන්, පී. එල්. සී.,
අංක 539, කෝට්ටේ පාර,
පිටකෝට්ටේ.
දුරකථන අංක 011- 2864164 - 5
ෆැක්ස් අංකය : 011- 2884556.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2445393
ඊමේල් : senaservice@sltnet.lk

04-710

---

**මහජන බැංකුව - කොච්චිකඩේ ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය
යටතේ වෙන්දේසියේ විකුණුම් දැන්වීම

මීගමුව මහ නගර සභා සීමාවේ තිඹිරිගස්කටුව ග්‍රාමයේ පල්ලන්චේන වත්ත නමැති ඉඩමේ වරිපනම් අංක 069/09 ඒ දරන ස්ථානයේ පිහිටි නිවස සහිත පර්. 10.0 ක් විශාල බිම් කොටස, මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2017.05.16 වැනි දින පෙ.ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

රජයේ ගැසට් පත්‍රයේ, 2015.07.10 දින ද, ඩේලි නිවුස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2015.06.29 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසීම.- මීගමුව නගරයේ සිට මීගමුව දළුපොත පාරේ වැඩ කඳවුර පසුකල විට වමට හමුවන පාරේ තුන්වන පටුමගේ වම්පසින් ඇති අංක 534/26 ඒ දරන ලිපිනයේ පිහිටි දේපළ. (වරිපනම් අංක 069/09 ඒ).

ගෙවීමේ ක්‍රමය .- වෙන්දේසිය අවසානයේ, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 % ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත කළමණාකාරිනී, මහජන බැංකුව, කොච්චිකඩේ ශාඛාව වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත්, දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය කළමනාකාර,
මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර, මුදුන්ගොඩ

දුරකථන අංක : 033-2222325, 033-2225008, 033-2231901
ෆැක්ස් අංකඃ 033-2226165, 033-2226741

''ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ / අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 125 ක සේවා විශිෂ්ටත්වය සමගින්.

ප්‍රධාන කාර්යාලය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

04-702

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේ දී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :-

(1) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අක්මීමණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 135 සී ගල්ගමුවකන්ද ග්‍රාමසේවා වසමට අයත් කලහේ පිහිටි ''ගල්ගමුවකන්ද'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. රූබසිංහ විසින් මැන සාදන ලද 2006 ක් වූ ජනවාරි මස 1, 2, 7 සහ 8 දින අංක 102 දරන පිඹුරෙහි ලොට් 29 වශයෙන් නිරූපිත නමැති ඉඩම සහ එහි පස, ගහකොළ, වැව්ලි සහ එය මත වූ සියල්ල ද සමග වේ. (විශාලත්වයඃ අ. 0 රූ. 0 පර්. 21.74)

(2) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අක්මීමණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 135 සී ගල්ගමුවකන්ද ග්‍රාමසේවා වසමට අයත් කලහේ පිහිටි ''ගල්ගමුවකන්ද'' බෙදා වෙන් කළ ලොට් 30 සහ 31 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. ගුණවර්ධන විසින් මැන සාදන ලද 2014 ක් වූ ජනවාරි මස 14 දින දරන අංක 1351 දරන පිඹුරෙහි ලොට්B (ලොට් 30 සහ ලොට් 31) වශයෙන් නිරූපිත නමැති ඉඩම සහ එහි පස, ගහකොළ, වැව්ලි සහ එයමත වූ සියල්ල ද සමග වේ. (විශාලත්වය :අ.0 රූ.0 පර්. 23)

(3) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අක්මීමණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක.135 සී ගල්ගමුවකන්ද ග්‍රාමසේවා වසමට අයත් කලහේ පිහිටි ''ගල්ගමුවකන්ද'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. රූබසිංහ විසින් මැන සාදන ලද 2006 ක් වූ ජනවාරි මස 1, 2, 7 සහ 8 දින දරන අංක 102 දරන පිඹුරෙහි ලොට් 35 වශයෙන් නිරූපිත නමැති ඉඩම සහ එහි පස, ගහකොළ, වැව්ලි සහ එයමත වූ සියල්ල ද සමග වේ. (විශාලත්වයඃ අ.0 රූ.0 පර්. 2.64)

(4) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අක්මීමණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක.135 සී ගල්ගමුවකන්ද ග්‍රාමසේවා වසමට අයත් කලහේ පිහිටි ''ගල්ගමුවකන්ද'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. රූබසිංහ විසින් මැන සාදන ලද 2006 ක් වූ ජනවාරි මස 1, 2, 7 සහ 8 දින දරන අංක 102 දරන පිඹුරෙහි ලොට් 33 වශයෙන් නිරූපිත නමැති ඉඩම සහ එහි පස, ගහකොළ, වැව්ලි සහ එයමත වූ සියල්ල ද සමග වේ.
(විශාලත්වය : අ. 0 රූ. 0 පර්. 10.51)

(5) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අක්මීමණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 135 සී ගල්ගමුවකන්ද ග්‍රාමසේවා වසමට අයත් කලහේ ''ගල්ගමුවකන්ද'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. රූබසිංහ විසින් මැන සාදන ලද 2006 ක් වූ ජනවාරි මස 1, 2, 7 සහ 8 දින දරන අංක 102 දරන පිඹුරෙහි ලොට් 34 වශයෙන් නිරූපිත නමැති ඉඩම සහ පස, ගහකොළ, වැව්ලි සහ එයමත වූ සියල්ලද සමග වේ.
(විශාලත්වය :අ. 0 රූ. 0 පර්. 10.56)

වර්ෂ 2017 ක් වූ මැයි මස 19 වැනි දින පෙ. ව 11.00 ට

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජේ. ටී. එල්. නන්දන විසින් සහතික කරන ලද වර්ෂ 2015.11.05 වන දිනැති අංක 10485 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදුකිරීම සද්නා ප්‍රසාදිනී වීරප්පෙරුම විසින් ''බන්ධනදයී/උකස්කරු'' ලෙස ද පැහැර හැර ඇති හෙයින්ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා - 2017.04.07 වැනි දින දී අයිලන්ඩ්, ලක්බිම, තිනක්කුරාල් පුවත්පත් සහ එදින ගැසට් පත ද බලන්න.

දේපළට පිවිසෙන මාර්ගය.- දකුණු අධිවේගී මාර්ග පිවිසුමේ සිට ගාලු පාර ඔස්සේ දකුණු අධිවේගී පිවිසුම් මාර්ගයේ මාර්ග සංඥා මංසන්ධිය දක්වා පැමිණ දකුණට හැරී අකුරැස්ස පාරේ කි. මී. 2.5 ක් ගමන් කරන්න. එතැනින් දකුණට ඇති සූරිය උයන පාරට හැරී මීටර් 300 ක් ගමන් කරන විට විෂයගත දේපළ හමු වේ.

ගෙවීමේ ක්‍රමය .- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් වියදම් මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) ද,
(4) ප්‍රචාරක වියදම් ද,
(5) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 500 ද,
(6) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදල හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදල තොරතුරු සඳහා කළමණාකරු, ණය අය කරගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී - ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03, දුරකථන : 0114667227

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස් සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3(50/3), විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185
ෆැක්ස් අංක :011 - 2572940.

04-742

---

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2017 අංක 491

MOD/DEF/07/01/AVF/887.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2017 මැයි මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුද ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජගත් නිශාන්ත ගමඇතිගේ, ශ්‍රීලංජාආබමු (නි/3609)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

04 - 711

---

## රජයේ නිවේදන

**1941 අංක 39 දරන ණයසහනදයක ආඥාපනත**

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම්දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදයක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදයක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25 (1) 26 (1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. කේ. රත්නසූරිය මිය,
ලේකම් (වැ.බ.),

ණය සහනදයක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.
ණය සහනදයක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව,
අංක 35ඒ.
ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, කොළඹ 08

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01)<br>44199 | ආරච්චි පතිරන්නැහැලාගේ ප්‍රියන්ත රංජිත් පතිරණ මයා,<br>වේරගල,<br>වරකාපොල. | විජේසිරිගේ ආරියරත්න විජේසිරි මයා,<br>"නිදහස",<br>මහපල්ලේගම. |
| (02)<br>44061 | ජයලත් පේඩිගේ රංජනී කුසුම්ලතා බස්නායක මිය,<br>අංක 341/3 බී,<br>සීතාවක උයන,<br>අංගම්පිටිය,<br>පාදුක්ක. | විජිත ෆිනෑන්ස් ලිමිටඩ්,<br>අංක 28,<br>හංවැල්ල පාර,"<br>පාදුක්ක. |
| (03)<br>44105 | හිටිහාමිල්ලාගේ පියරත්න මයා,<br>අංක 19/21,<br>රන්මුද්දුවල වත්ත,<br>හෙට්ටිගෙදර, මාස්පොත. | මැදකොටුවේ ගෙදර හැරිසන් මයා,<br>අන්නාසිගල,<br>මොලගොඩ, |
| (04)<br>43683 | කාටයියා එන්කන්නා සිවාජී මයා,<br>අංක 8/12,<br>දෙයියන්නේවෙල,<br>මහනුවර. | බාලා සිවසුබ්‍රමනියම් මයා,<br>අංක 10/37,<br>දෙයියන්නේවෙල,<br>මහනුවර. |
| (05)<br>44148 | කස්තුරි ආරච්චිගේ දෙන් දයා මල්ලිකා මිය.<br>අංක 717/2/ඒ,<br>යටිහේන,<br>මල්වාන. | ඩී. එස්. පී. කාරියප්පෙරුම,<br>නිවාස හා දේපළ වෙළෙඳාම් සමාගම,<br>අංක 666/10,<br>නව නුවර පාර,<br>යටිහේන, මල්වාන. |

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (06)<br>44181 | අබ්දුල් ලතීෆ් සිත්ති මුෂුද මයා,<br>ගල්ලිද කමව වත්ත,<br>හෙට්ටිපොල. | රාජසිංහ ආරච්චිලාගේ රම්‍යලතා මිය,<br>කුලියාපිටිය පාර,<br>හෙට්ටිපොල. |
| (07)<br>43831 | මුතුතන්ත්‍රිගේ ප්‍රභාත් චමින්ද කුරේ මයා,<br>ලිවේරා වත්ත,<br>කටුකෙන්ද,<br>බඩල්ගම. | බ්‍රේසියා ග්‍රාමීන් (ප්‍රයිවට්) ලිමිටඩ්,<br>අංක 88/2,<br>හලාවත පාර,<br>කට්ටුව, මීගමුව. |
| (08)<br>40958 | පලිහේනගේ මහේෂ් චතුරංග පෙරේරා මයා,<br>අංක 55,<br>සමගි මාවත,<br>රඹුක්කන, බණ්ඩාරගම. | මහමච්චිගේ මංගල දයාසිරි මයා,<br>අංක 45/5,<br>රැක්ගහවත්ත,<br>පඤ්ඤානන්ද මාවත,<br>වෑකඩ, පානදුර. |
| | | පැලමණ්ඩිගේ සමන්ති දීප්තිකා මිය,<br>අංක ඒ 3-සී,<br>පඤ්ඤානන්ද මාවත,<br>වෑකඩ, පානදුර. |
| | | එම්. බී. එස්. එල්. ඉතිරි කිරීමේ බැංකුව,<br>අංක 519,<br>ජායා මාවත, කොළඹ 10. |
| (09)<br>44260 | එදිරිසිංහ විතානගේ රේවත කුමාර මයා,<br>අංක 62,<br>බදුවත්ත, පහත්ගම, හංවැල්ල. | එදිරිසිංහ විතානගේ අමිල සම්පත් එදිරිසිංහ මයා,<br>අංක 212/බී/1,<br>ඉහළ හංවැල්ල, හංවැල්ල. |
| (10)<br>44142 | වික්‍රම හෙට්ටියා කොන්තහෙලාගේ මාරි කාන්ති මාර්කස් මිය,<br>අංක 16/1.<br>කපාල කන්ද පාර, ජාඇල. | අයිනපුල්ලිගේ රුවනි දූෂාන්ති ප්‍රනාන්දු මිය,<br>"මල්ෂිනි",<br>හත්තිනිය, මාරවිල. |
| (11)<br>44152 | අතලගේ සුමතිපාල මයා,<br>අංක 72/2/ඊ,<br>සේරම්වත්ත,<br>පහළ ඉඹුල්ගොඩ, ඉඹුල්ගොඩ. | නිලන්ත විජේසිංහ මයා,<br>අංක 405,<br>මිල්ලගහවත්ත,<br>ගණේමුල්ල. |
| (12)<br>44270 | ලුවිස්දුර ගීත් කුමාර සිල්වා මයා,<br>අංක 248ඒ,<br>පොල්දුව වත්ත,<br>සාදමුල්ල, බටපොල. | මහවෙල ගමගේ විශාකා ගෝතමී සමරසේකර මිය,<br>සව්සිරි උයන,<br>සාදමුල්ල, බටපොල, |
| (13)<br>44201 | මානා ආනා සෙයියඩ් අබුසාලි,<br>අංක 334.<br>සල්මා විලා,<br>ප්‍රධාන වීදිය, දික්ඔය. | වේලායිතන් රාමසාමි මයා,<br>අංක 105,<br>සයිඩ් ස්ට්‍රීට්,<br>හැටන්. |
| (14)<br>44238 | කස්තුරි ආරච්චිගේ දීපිකා දමයන්ති මිය,<br>අංක 196/ඒ/10,<br>අලුබෝවිල,<br>දෙල්ගොඩ. | ඩී. එස්. පී. කාරියප්පෙරුම,<br>නිවාස හා දේපළ වෙළෙඳාම් සමාගම,<br>අංක 666/10,<br>නව නුවර පාර,<br>යටිහේන, මල්වාන. |
| (15)<br>44212 | සූරිය ආරච්චිගේ අසංක උදයප්‍රිය පෙරේරා මයා,<br>අංක 63/2/බී,<br>ලයනල් සිරිවර්ධන මාවත,<br>ඉහළ ලුණුගම, වානලුවාව | ඩී. එස්. පී. කාරියප්පෙරුම,<br>නිවාස හා දේපළ වෙළෙඳාම් සමාගම<br>අංක 666/10,<br>නව නුවර පාර,<br>යටිහේන, මල්වාන. |
| | සූරියආරච්චිගේ හේමසිරි පෙරේරා මයා,<br>අංක 63/2/බී,<br>ලයනල් සිරිවර්ධන මාවත,<br>ඉහළ ලුණුගම, වානලුවාව | |
| (16)<br>44242 | ගමගේ ස්වර්ණලතා මිය,<br>මහවත්ත,<br>පටුවත, දෙඩන්දූව. | සුනේත්‍රා සූරිආරච්චි මිය,<br>ලාහමුල්ල,<br>මාබොටුවන, වඳුරඹ. |

04 - 709

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk